# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2321/73 – 2023 මාර්තු මස 03 වැනි සිකුරාදා – 2023.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිතලගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MA/THG/2020/380 හා 2020.12.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 'A' – ජම්බුගහලියද්ද – ප්‍රමාණය: හෙක්. 0.0253**
උතුරට: සේනානායක ගමගේ සාලිය ගෝවින්ද හිමිකම් කියන ජම්බුගහලියද්ද සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B; නැගෙනහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B, මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ අයිතිකරු සොයාගත නොහැකි මුරුතගහමුලන; දකුණට: අයිතිකරු සොයාගත නොහැකි මුරුතගහමුලන සහ නිල්වලා ගඟ; බටහිරට: නිල්වලා ගඟ සහ සේනානායක ගමගේ සාලිය ගෝවින්ද හිමිකම් කියන ජම්බුගහලියද්ද.

02. **කැබලි අංක 'B' – ජම්බුගහලියද්ද – ප්‍රමාණය: හෙක්. 0.0060**
උතුරට: සේනානායක ගමගේ සාලිය ගෝවින්ද හිමිකම් කියන ජම්බුගහලියද්ද; නැගෙනහිරට:මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ අයිතිකරු සොයාගත නොහැකි මුරුතගහමුලන; දකුණට: අයිතිකරු සොයාගත නොහැකි මුරුතගහමුලන සහ කැබලි අක්ෂර A; බටහිරට: සේනානායක ගමගේ සාලිය ගෝවින්ද හිමිකම් කියන ජම්බුගහලියද්ද.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2020/WS/32.
2022 නොවැම්බර් මස 11 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03-0027



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 109F, ඉහලගොඩ, ජනපදය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ (අ.ග.පි. 658) ඉහලගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/AKM/2020/458 හා 2020.10.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 'A' – වවුළුගලගොඩ – ප්‍රමාණය: හෙක්. 0.0379**

උතුරට: කැබලි අංක 630 සහ 634; නැගෙනහිරට: කැබලි අංක 634; දකුණට: කැබලි අංක 630; බටහිරට: කැබලි අංක 630.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2019/WS/559.
2023 ජනවාරි මස 05 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03-0028

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.